රුහුණ විශ්වවිද්‍යාලය

කළමනාකරණ හා මූල්‍ය පීඨය

වාණිජ පරිපාලනවේදී උපාධි පාඨමාලාව 1000 ස්ථලය පළමු සමාසික අවසාන පරීක්ෂණය - පුනර් (සැප්තැම්බර් / ඔක්තෝබර් 2020)

අධ්‍යයන වර්ෂය 2019/2020

**BBA 1102 - මූල්‍ය ගිණුම්කරණය** කාලය : පැය තුනයි

**ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 04 න් සමන්විත වේ.**

**උපදෙස්**

**සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**ගණක යන්ත්‍ර භාවිතා කිරිමට ඉඩ දෙනු ලැබේ.**

**සියළුම පෙර වැඩ පිළිතුරු පත්‍රයට ඇමිනිය යුතුයි.**

---

*ප්‍රශ්න අංක 01*

පහත දැක්වෙන ශේෂ පිරිස්සුම 2020 මාර්තු 31 වන දිනට රිපිට් සමාගමේ පොත් වලින් උපුටා ගෙන ඇත.

| විස්තරය | හර. (රුපි.'000) | බැර. (රුපි.'000) |
|---|---|---|
| *2020 මාර්තු 31 වන දිනට දේපල , පිරියත හා උපකරණ පිරිවැයට සහ 2019 අප්‍රේල් 01 දිනට ඒවායේ සමුච්චිත ක්ෂය.* | | |
| ඉඩම | 6,000 | - |
| ගොඩනැගිලි | 5,000 | 1,000 |
| මෝටර් රථ | 7,000 | 2,000 |
| කාර් යාල උපකරණ | 5,000 | 1,000 |
| විකුණුම් පිරිවැය හා විකුණුම් | 20,000 | 41,000 |
| වෙළඳ ලැබිය යුතු දෑ හා වෙළඳ ගෙවිය යුතු දෑ | 8,000 | 3,000 |
| තොග | 5,000 | |
| පරිපාලන වියදම් | 3,000 | |
| බෙදාහැරීමේ වියදම් | 5,000 | |
| වෙනත් වියදම් | 1,000 | |
| මූල්‍ය වියදම් | 1,000 | |
| ගෙවූ බදු | 1,000 | |
| ගෙවූ සාමාන කොටස් ලාභාංශ | 1,000 | |
| බැංකුවේ මුදල් | 3,000 | |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රා ග් ධනය | | 11,000 |
| නිදහස් කළ හැකි වරණීය කොටස් ප්‍රා ග් ධනය | | 3,000 |
| 2019 අප්‍රේල් 01 දිනට රඳවා ගත් ලාභ | | 4,000 |
| 12% බැංකු ණය | | 3,000 |
| 2019 අපෙ‍්‍ර ල් 01 දිනට අඩමාන ණය සඳහා වෙන් කිරීම | | 1,000 |
| වෙනත් ආදායම් | | 1,000 |
| | **71,000** | **71,000** |

*පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත:*

1. *තොග*

2020 මාර්තු 31 වන දිනට අවසන් තොග වල පහත දෑ අඩංගු වේ .

a) 2020 ජනවාරි 31 වන දින ඒකකයක් රු. 10 බැගින් මිළදී ගත් රුපියල් මිලියන 01ක් වටිනා භාණ්ඩ නිතර අලෙවි නොවන භාණ්ඩ ලෙස හඳුනා ගෙන ඇති අතර ඒකකයක් රුපියල් 08 බැගින් විකිණිය හැකිය..

b) විකිණීම හෝ ආපසු එවීමේ පදනම මත යවන ලද රුපියල් 500,000 ට ලකුණු කළ තොගයක් විකුණුම් ලෙස සටහන් කර ඇති අතර සමාගම පිරිවැය මත 25% ලාභාන්තිකයක් තබා ගෙන ඇත..

2. *බැංකු ණය*

12% බැංකු ණය සෑම වාරිකයක්ම ගෙවන දිනට ඇති ශේෂයට ගණනය කරන ලද පොළියද සහිතව රු. 50,000 බැගින් වූ සමාන මාසික වාරික වශයෙන් නැවත ගෙවිය යුතුය. සෑම වාරිකයක්ම එක් එක් මාසය අවසාන දිනට ගෙවිය යුතුය. 2020 මාර්තු වාරිකය සඳහා වෙන් කළ යුතුය.

3. *දේපළ, පිරියත හා උපකරණ*

a) 2019 ඔක්තෝබර් 01 දින රු. මිලියන 1.2ට නව මෝටර් රථයක් මිළදී ගන්නා ලදී. එම මෝටර් රථය මිළදී ගැනීමේදී 2014 ඔක්තෝබර් 01 දින රුපියල් මිලියන 1ට මිළදී ගත් පැරණි මෝටර් රථයක් රුපියල් 200,000කට හුවමාරු කර ඇත. ශේෂය පියවීම සඳහා වාර්ෂික පොලි අනුපාතය 12% බැගින් බැංකු ණයක් ලබා ගෙන ඇත. ලබා ගත් රුපියල් මිලියන 01ක බැංකු ණය මෝටර් රථයේ පිරිවැය ලෙස මෝටර් රථ ගිණුමට හර කොට බැංකු ණය ගිණුමට බැර කිරීම හැර වෙනත් කිසිදු සටහනක් මේ පිළිබඳ තබා නොමැත.

b) 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 1.6ට මිළදී ගත් කාර්යාල උපකරණ 2020 ජනවාරි 01 දින රුපියල් මිලියන 1.2ට ඉවත් කර ඇත. විකිනීමෙන් ලද මුදල බැංකු ගිණුමට හර කොට විකුණුම් ගිණුමට බැර කොට ඇත. මේ පිළිබඳ වෙනත් කිසිදු සටහනක් ගිණුම් වල තබා නොමැත.

c) 2020 මාර්තු 31 වන දින සමාගමේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යා ගනනය කර ඇති අතර ඇගයීම් වාර්තාවට අනුව ප්‍රත්‍යාගණනය අගයන් පහත දැක්වේ. වර්තමාන වර්ෂයේ ප්‍රත්‍යාගණනය සම්බන්ධ සටහන් ගිණුම් පොත් වල මේ වනතුරුත් වාර්තා කර නැත.

| ඉඩම( රුපි.*'000)* | ගොඩනැගිලි ( රුපි. *'000)* | ගොඩනැගිල්ලේ නැවත අගය කළ ඉතිරි ඵලදායී ජීවිත කාලය. |
|---|---|---|
| 7,000 | 4,250 | වසර 20 |

*d)* ***දේපළ, පිරියත හා උපකරණ සඳහා පහත අනුපාතයන්ගෙන් ක්ෂය වීම් වෙන් කළ යුතු වේ.***

| ***දේපළ, පිරියත හා උපකරණ*** | **වාර්ෂික ක්ෂය අනුපාතය** |
|---|---|
| ගොඩනැගිලි | 05% |
| මෝටර් රථ | 20% |
| කාර්යාල උපකරණ | 10% |

*4)* ***බොල් ණය හා අඩමාන ණය සඳහා වෙන් කිරීම.***

2020 මාර්තු 31 වන දිනට ශේෂ පිරික්සුමේ ඇතුළත් රුපියල් 200,000ක වෙළඳ ලැබිය යුතු ශේෂයක් 2020 අප්‍රේල් 20වන දින බුන්වත් වූ බවට ප්‍රකාශ කර ඇත. වාර්තා කරන දිනට පවතින වෙළඳ ලැබිය යුතු ශේෂය සඳහා 10% පොදු අඩමාන ණය වෙන් කිරීමක් කළ යුතු වේ..

*5)* ***ආදායම් බදු.***

ශේෂ පිරික්සුමේ පෙන්නුම් කරන බදු ගිණුම තුළ 2018 / 2019 තක්සේරු වර්ෂය සඳහා රුපියල් 200,000ක ඌණ වෙන් කිරීම හා 2019/2020 තක්සේරු වර්ෂය සඳහා ස්වතක්සේරුව මත ගෙවූ රුපියල් 800,000ක් ඇතුළත් වේ. 2020 මාර් තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා රුපියල් මිලියන 2ක ආදායම් බදු ඇස්තමේන්තු කර ඇත.

***අවශ්‍ය වන්නේ:***
***ප්‍රසිද්ධ කිරීම සඳහා පහත දෑ පිළියෙල කරන්න.***

a. 2020 මාර් තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්න ආදායම් ප්‍රකාශනය.
b. 2020 මාර් තු 31 වන දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය.
c. 2020 මාර් තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය.
d. දේපළ, පිරියත සහ උපකරණ සංචලනය දැක්වෙන ප්‍රකාශනය.

(මුළු ලකුණු 25)

ප්‍රශ්න අංක *02*

2019 අප්‍රේල් 01 දින පියල් සමාගම සිරි සමාගමේ සමාන්‍ය කොටස් ප්‍රග්ධනයෙන් 80%ක් අත්පත් කර ගන්නා ලදී. එදිනට සිරි සමාගමේ රඳවා ගත් ඉපයුම් රුපියල් මිලියන 2ක් විය. 2019 අප්‍රේල් 01 දිනට සිරි සමාගමේ කොටසක වෙළඳපොළ අගය රුපියල් 25ක් වූ අතර සාමාන්‍ය කොටස් 200,000ක් නිකුත් කර ඇත. 2020 මාර්තු 31 වන දිනට පහත දැක්වෙන මූල්‍ය තත්ව ප්‍රකාශන සමාගම් 2හි පොත් වලින් උපුටා ලන්නා ලදී.

| විස්තරය | පියල් (රුපි.*'000)* | සිරි (රුපි.*'000)* |
|---|---:|---:|
| වත්කම් | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපළ ,පිරිවත සහ උපකරණ | 4,000 | 3,000 |
| සිරි සමාගමේ ආයෝජන | 4,000 | - |
| **ජංගම වත්කම්** | | |
| තොග | 1,400 | 1,500 |

| | | |
|---|---:|---:|
| වෙළඳ ලැබිය යුතු | 800 | 1,000 |
| මුදල් හා සමාන දෑ | 800 | 500 |
| **මුළු වත්කම්** | **11,000** | **6,000** |
| **ස්කන්ධය** | | |
| ප්‍රකාශිත සාමානය කොටස් ප්‍රග්ධනය | 5,000 | 2,000 |
| රදවා ගත් ඉපයුම් | 4,000 | 3,000 |
| **ජංගම වගකීම්** | | |
| වෙළඳ ගෙවිය යුතු | 1,000 | 800 |
| උපචිත ආදායම් බදු | 1,000 | 200 |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | **11,000** | **6,000** |

පහත සඳහන් තොරතුරු සපයා ඇත.

1. පියල් සමාගම පිරිවැයට 25%ක ලාභයක් සහිතව සිරි සමාගමට භාණ්ඩ විකුණයි. 2020 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය තුළදී සිරි සමාගම රුපියල් මිලියන 01කට ඉන්වොයිස් කරන ලද භාණ්ඩ ලද අතර ඉන් 25%ක් සිරි සමාගමේ අවසාන තොගයේ අන්තර්ගතව ඇත.

2. 2020 මාර් තු 31 වන දින පියල් සමාගමේ වෙළඳ ලැබිය යුතු ශේෂයෙහි සිරි සමාගමෙන් ලැබිය යුතු රුපියල් 200,000ක් පෙන්නුම් කරන අතර එදිනට සිරි සමාගමේ වෙළඳ ගෙවිය යුතු ශේෂයේ පියල් සමාගමට ගෙවිය යුතු රුපියල් 100,000ක් පෙන්නුම් කරයි. සිරි සමාගම විසින් 2020 මාර්තු 30 දින ප්‍රේෂණය කළ මුදල 2020 මාර්තු 31 දින වන විට පියල් සමාගමට ලැබී නොතිබීම මෙම ශේෂ දෙක අතර වෙනසට හේතු වී ඇත.

3. පියල් සමාගම 2019 ඔක්තෝබර් 01 දින රුපියල් 200,000ක ලාභයක් සහිතව මෝටර් රථයක් සිරි සමාගමට විකුණා ඇත. සිරි සමාගම වාර්ෂිකව 20% බැගින් මෝටර් රථ ක්ෂය කරනු ලබයි.

4. 2020 මාර්තු 31 වන දින සිදු කල හානි කරන පරීක්ෂණයේදී රුපියල් 500,000කින් කීර්තිනාමය හානිකරණය වී ඇති බව අනාවරණය වී ඇත.

අවශ්‍යවන්නේ **:**

2020 මාර් තු 31 වන දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ව ප්‍රකාශනය පිළියෙළ කිරීම.

(මුළු ලකුණු 15)

ප්‍රශ්න අංක. ***03***

අලි සමාගමේ පොත් වලින් පහත සඳහන් මූල්‍ය තත්ව ප්‍රකාශන 02ක උපුටා ගෙන ඇත.

| විස්තරය | ***31.03.2019*** | ***31.03.2020*** |
|---|---:|---:|
| | ***(රුපි.'000)*** | ***(රුපි.'000)*** |
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපළ පිරිවත හා උපකරණ | 9,000 | 8,000 |
| ආයෝජන | 1,500 | 1,700 |
| **ජංගම වත්කම්** | | |
| තොග | 1,700 | 1,500 |
| ලැබිය යුතු ගිණුම් | 800 | 1,200 |

| | | |
|---|---|---|
| ලැබිය යුතු ආයෝජන ආදායම | 100 | 200 |
| මුදල් හා මුදල් සමාන දෑ | 900 | 3000 |
| ***මුළු වත්කම්*** | ***14,000*** | ***15,600*** |
| **ස්කන්ධය හා වගකීම්** | | |
| **ස්කන්ධය** | | |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 6,000 | 7,100 |
| ඉඩම් ප්‍රත්‍යාගණන සංචිත | 300 | 600 |
| රඳවා ගත් ඉපැයුම් | 3,100 | 3,800 |
| **ජංගම නොවන වගකීම්** | | |
| 18% බැංකු ණය | 800 | 1,000 |
| 12% ණය කර | 1,000 | 600 |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 400 | 300 |
| **ජංගම වගකීම්** | | |
| ගෙවිය යුතු ගිණුම් | 2,100 | 1.900 |
| උපචිත පොලී | 200 | 100 |
| උපචිත ආදායම් බදු | 100 | 200 |
| ***මුළු ස්කන්ධය හා වගකීම්*** | ***14,000*** | ***15,600*** |

***පහත සඳහන් අතිරේක තොරතුරු අදාළ වේ.***

1. 2015 ජුලි 01 දින රුපියල් මිලියන 1.5ට මිළදී ගත් මෝටර් රථයක් 2019 ජුලි 01 රුපියල් 500,000ට විකුණන ලදී. මෝටර් රථ වාර්ෂිකව 20% බැගින් සරල මර්ග ක්‍රමයට ක්ෂය කර ඇත. වර්ෂය සඳහා මුළු ක්ෂය වීම් රුපියල් මිලියන 2ක් විය.

2. වර්ෂය සඳහා ආදායම් බදු රුපියල් 500,000ට ඇස්තමේන්තු කර ඇත.

3. වර්ෂය සඳහා ආයෝජන ආදායම සහ මුළු පොළිය පිළිවෙලින් රුපියල් 300,000ක සහ රුපියල් 400,000ක් විය.

4. සමාගම වර්ෂය තුළදී රුපියල් 200,000ක අතරු ලාභාංශ ගෙවා ඇත.

5. වර්ෂය තුළදී රුපියල් 100,000ක විශ්‍රාම පාරිතෝෂිකයක් ගෙවා ඇත.

***අවශ්‍යවන්නේ:***

2020 මාර් තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කිරීම.

(මුළු ලකුණු 15)

ප්‍රශ්න අංක ***04***

අනිල්, බුද්ධික සහ චමල් ලාභ අලාභ පිළිවෙලින් 2:2:1 අනුපාතයට බෙදා ගනු ලබන හවුල් ව්‍යාපාරයක හවුල් කරුවන් වන අතර ඔවුන් 2020 අප්‍රේ ල් 01 දින හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට තිරනය කර ඇත. 2020 මාරතු 31 වන දිනට හවුල් ව්‍යාපාරය මූල්‍ය තත්ව ප්‍රකාශනය පහත පරිදි වේ.

| විස්තරය | රු.'000 | රු.'000 |
| --- | --- | --- |
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 13,000 | |
| මෝටර් රථ | 3,000 | |
| ලි බඩු | 2,000 | 18,000 |
| ජංගම වත්කම් | | |
| තොගය | 3,000 | |
| ලැබිය යුතු ගිණුම් | 2,000 | |
| බැංකුවේ මුදල් | 1,000 | 6,000 |
| ***මුළු වත්කම්*** | | ***24,000*** |
| ස්කන්දය හා වගකිම් | | |
| ප්‍රාග්ධන ගිණුම් - අනිල් | 10,000 | |
| - බුද්ධික | 6,000 | |
| - චමල් | 2,000 | 18,000 |
| ජංගම ගිණුම් - අනිල් | 2,000 | |
| - බුද්ධික | (1,000) | |
| - චමල් | 1,000 | 2,000 |
| ණය – බුද්ධික | | 3,000 |
| ජංගම වගකිම් | | |
| ගෙවියු යුතු ගිණුම් | | 1,000 |
| ***මුළු ස්කන්ධය හා වගකීම්*** | | ***24,000*** |

***පහත සඳහන් අතිරේක තොරතුරුද සපයා ඇත.***

1. **වත්කම් පහත පරිදි උපලබ්ධි විය.**

| | රු.'000 |
| --- | --- |
| ඉඩම් හා ගොඩනැගිලි.............................. | 14,000 |
| මෝටර් රථ.................................. | 2,800 |
| ලී බඩු.......................................... | 2,000 |
| තොගය......................................... | 3,000 |
| ලැබිය යුතු ගිණුම්........................... | 1,800 |

2. ගෙවිය යුතු ගිණුම් පියවීමේදී රුපියල් 200,000ක මුළු වට්ටම් ප්‍රමාණයක් ලබා දී තිබුනි.
3. උපලබ්ධි වියදම රුපියල් 500.000ක් විය.

***අවශ්‍යවන්නේ:***

a. උපලබ්ධි ගිණුම,

b. බැංකු ගිණුම සහ

c. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්.

(මුළු ලකුණු 15)

*******************